සබරගමුව පළාත් සභාව - சப்ரகமுவமாகாணசபை - Sabaragamuwa Provincial Council
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்விதகவல்தொழில்நுட்பம்மற்றும்கலாச்சாரநடவடிக்கைகளுக்கானஅமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk
PMoE Sabaragamuwa

අමාත්‍යාංශ ලේකම් / Secretary — Office – 045 2223015 Residence

කාර්යාලය / Office — නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number: MEDU/AD/15/01/මා.ම./2025-26

ඔබේ අංකය / உமது இல / Your Number:

දිනය / திகதி / Date: 2025.11. 24

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, සබරගමුව පළාත,

සබරගමුව පළාතේ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සබරගමුව පළාත් පාසල්වල සියලුම විදුහල්පතිවරුන්,

සබරගමුව පළාත් පාසල්වල සියලුම ගුරුභවතුන්,

**<u>සබරගමුව පළාත් සහා පාසල්වල ගුරුභවතුන්ගේ වාර්ෂික පළාත් ගුරු ස්ථාන මාරු මණ්ඩල නියෝග දැනුම් දීම - 2025/26 වර්ෂය</u>**

සබරගමුව පළාතේ පළාත් සහා පාසල්වල සේවය කරනු ලබන ගුරුභවතුන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම මගේ සමාංක හා 2025.07.01 දිනැති නිවේදනයෙන් සිජතතු දත්ත පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සිදු කරන ලදී. එම අයදුම්පත් සම්බන්ධයෙන් සළකා බැලීමෙන් පසු පළාත් ගුරු ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ සළකා බලා, **2026.01.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් වෙත ලබා දී ඇති ස්ථාන මාරු නියෝග <u>www.semis.lk</u> යන වෙබ් අඩවිය වෙත මුදාහැර ඇති බව කාරුණිකව දන්වමි.

02. මෙම ස්ථාන මාරු සබරගමුව පළාතේ ගුරු සේවයේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව ගුරුභවතුන්ගේ ඉල්ලීම් හා සේවා අවශ්‍යතා සළකා බලා තීරණය කර ඇත. ඒ අනුව ඔබ පාසලේ සේවය කරනු ලබන ස්ථාන මාරුලාභී ගුරුභවතුන්ගේ අනුප්‍රාප්තිකයන් සේවයට වාර්තා කරන තෙක් රඳවා නොගෙන 2026.01.01 දිනට තම නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමට කටයුතු කරන ලෙසත්, **නියමිත දිනට සේවයෙන් නිදහස් නොකිරීමෙන් ඇතිවන ගැටළු සම්බන්ධයෙන් එම ආයතන ප්‍රධානීන් වගකීමට බැඳෙන බවත්** වැඩිදුරටත් දන්වා සිටිමි. එබැවින් මෙම ස්ථාන මාරු වඩාත් ඵලදායී හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමි.

03. තවද ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් ස්ථාන මාරු වී යාමට ප්‍රථම අදාළ නිලධාරියා භාරයේ ඇති රජයට අයත් දේපළ , ලිපි ලේඛන හා මිල මුදල් හෝ වෙනයම් දෙයක් වේ නම් ඒවා නම් කරනු ලබන අයෙකුට විධිමත් පරිදි භාර දීමට කටයුතු සැළැස්විය යුතුය.

CamScanner

04. මෙම ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් කිසියම් ගුරුභවතෙකු අභියාචනා කිරීමට අපේක්ෂා කරන්නේ නම්, මේ සමග යොමු කර ඇති අභියාචනා ආකෘති පත්‍රය ප්‍රකාරව පමණක් අභියාචනා යොමු කළ යුතු අතර, ඔබගේ අභියාචනයේ සඳහන් කරුණු තහවුරු කෙරෙන සියලු ලිපි ලේඛන ද ඒ සමග අමුණා එවීමට කටයුතු කිරීම ඔබ සතු වගකීමකි.

05. ඒ අනුව 2025.12.08 දිනට ප්‍රථම " **ලේකම්,අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය ,රත්නපුර** " ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර , අභියාචනය බහා එවන ලිපි කවරයේ වම් පස කෙළවරේ **"ගුරු ස්ථාන මාරු අභියාචනා - 2025/26 "** ලෙස අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය .

06. 2025.12.08 දිනෙන් පසුව ලැබෙන අභියාචනා සළකා නොබලන බව ද කාරුණිකව දන්වා සිටිමි.



**බී.ඒ.සී.පී.බමුණුආරච්චි**

**ලේකම්**

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,

සබරගමුව පළාත් සභාව.

බී.ඒ.සී.පී. බමුණුආරච්චි
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නවනගරය - රත්නපුර

අභියාචනා අයදුම්පත් අංකය
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

## 2025/26 වාර්ෂික පළාත් ගුරු ස්ථාන මාරු අභියාචනා මණ්ඩලය

### අභියාචනා

ඔබ පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලය - ..........................................................................

ඔබ ස්ථාන මාරු අපේක්ෂා කරන පළාත/කලාපය - ..........................................................................

1. මුලකුරු සමඟ නම - ..........................................................................

2. 2025.12.31 දිනට වයස: - අවු ....... මාස.......

3. ජාතික හැඳුනුම්පත් අංකය -..........................................................................

4. සේවය කරන පාසල - ..........................................................................

5. මුල් පත්වීම් දිනය -..........................................................................

6. පත්වීම් විෂයය -.......................................................... භාෂා මාධ්‍යය ...................................

7. ඉගැන්වීමේ විෂයය -..........................................................................

8. වර්තමාන පාසලේ වැඩ භාරගත් දිනය හා **2025.12.31** දිනට සේවා කාලය **(අන්තර් කලාප)** - ..................... (අවු:...... මාස.....)

9. සබරගමුව පළාතේ සේවා කාලය **2025.12.31** දිනට සේවා කාලය **(අන්තර් පළාත්)** - (අවු .... මාස....)

10. වාර්ෂික පළාත් ගුරු ස්ථාන මාරු මණ්ඩල නියෝගය -

..........................................................................................................................................

11. ඔබ අන්තර් කලාප ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම්, ඉල්ලා සිටින පාසල් 5ක් සඳහන් කරන්න.

    I ..........................................................
    
    II..........................................................
    
    III..........................................................
    
    IV..........................................................
    
    V..........................................................

12. අභියාචනා කරුණු ඇමුණුමක් වශයෙන් ඉදිරිපත් කරන්න.

**(අභියාචනා කරුණු තහවුරු කරන ලිපි ලේඛන ඇත්නම් ඒවා ද අනිවාර්යයෙන් මේ සමඟ අමුණා එවිය යුතුය. )**

මෙම අයදුම්පතේ මා විසින් සඳහන් කර ඇති සියලු තොරතුරු හා මේ යොමු කරන ඇමුණුම් සත්‍ය හා නිවැරදි බව තහවුරු කරමි.

......................................          ..................................................

දිනය                    අත්සන

13. විදුහල්පතිගේ නිර්දේශය -
    ඉහත ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය - ..........................          විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව - ..............................

CamScanner